**ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය - 2013**

---

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2006 අංක 17 දරන ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය පනතේ 20(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිති වලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුලත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

2013 දෙසැම්බර් 31 දිනට ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති,රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2006 අංක 17 දරන ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය පනතේ 19(3) වගන්තිය | අදාල නියමයන්ට අනුව අධිකාරිය විසින් තාක්ෂණ සංවර්ධන අරමුදලක් පිහිටුවා තාක්ෂණ සංවර්ධන කාර්යයක් සඳහා වෙන් කරන ලද හෝ ලැබෙන සියළු මුදල් එම අරමුදලට බැර කළ යුතු වුවත්, පනතේ දින සිට සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් එනම් වසර 08 ක් ගත වී ඇතත් එම අරමුදල පිහිටුවා නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i). මුදල් රෙගුලාසි 103 හා 104 | 2012 වර්ෂයේදී අනතුරකට පත් වූ වාහනයක් වෙනුවෙන් අධිකාරියට සිදු වූ රු.56,279 ක්වූ මූල්‍ය අලාභය අදාල වගකිවයුතු පාර්ශවයෙන් 2013 දෙසැම්බර් 31 දිනටද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ii). මුදල් රෙගුලාසි. 371(2)(ආ) | • විධිවිධාන වලට පටහැනිව රු.20,000 සීමාව ඉක්මවා අවස්ථා 31 කදී එකතුව රු.1,287,099 ක් වූ අත්තිකාරම් ගෙවා තිබුණු අතර මාණ්ඩලික නොවන නිලධාරීන්ට එකතුව රු.348,240 ක්වූ අත්තිකාරම් ලබාදී තිබුණු අවස්ථා 10 ක් විය.<br>• මුල් අත්තිකාරම් මුදල නිරවුල් කර නොතිබියදී අවස්ථා 25 කදී එකතුව රු.529,350 ක් වූ අත්තිකාරම් නැවත ලබාදී තිබුණි.<br>• අත්තිකාරම් අවශ්‍ය කාරණය හා අවශ්‍ය මුදල නිවැරදිව හඳුනා නොගෙන අත්තිකාරම් ලබාදීම හේතුවෙන් අවස්ථා 45 කදී දෙන ලද අත්තිකාරම් මුදලින් සියයට 30 කට වැඩි ප්‍රමාණයක් එනම් එකතුව රු. 944,330 ක් ඉතිරිව තිබූ අවස්ථා නිරීක්ෂණය විය. |

| | |
|---|---|
| (ඇ) 2011 අප්‍රේල් 29 දිනැති අංක පීර්ඩී/58 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | සභාපතිවරයා වෙනුවෙන් අනුමත මාසික දීමනාව රු. 50,000 ක් වුවද, 2012 වර්ෂයේ ජනවාරි සිට ජුලි මාසය දක්වා මාසිකව රු.62,695 බැගින් සභාපතිවරයාට ගෙවා තිබීම නිසා, සභාපති දීමනාව රු.88,865 ක්ද, සියයට 10 යේ අමතර දීමනාව රු.8,890 ක්ද, සේවක අර්ථසාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදල් වියදම රු.13,328 ක්ද ලෙස එකතුව රු. 111,083 ක් වැඩිපුර ගෙවා තිබූ අතර එම මුදල ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඈ) 2011 ජුනි 01 දිනැති අංක එන්එස්සීසී/2/7/5/5/113 දරන ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ ලිපිය | අනුමත වැටුප ඉක්මවා, අධිකාරියේ අධ්‍යක්ෂවරයා වෙත වැටුප් හා දීමනා ගෙවා තිබීම හේතුවෙන් 2012 වර්ෂයේදී රු.252,450 ක් සමාලෝචිත වර්ෂයේදී රු.252,450 ක් හා වශයෙන් 2013 දෙසැම්බර් 31 දිනට රු.504,900 ක් වැඩිපුර ගෙවා තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ අධිකාරියේ වැඩ කටයුතු වලින් රු.521,069 ක ඌනතාවයක් පෙන්නුම් කළ අතර, ඉකුත් වර්ෂයේ ඊට අනුරූපීව රු.2,050,079 ක ඌනතාවයක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.1,529,010 ක වාසිදායක වර්ධනයක් නිරීක්ෂණය වූ අතර එම වර්ධනය කෙරෙහි වර්ෂයේ සංවර්ධන වියදම් රු.1,093,254 කින් අඩුවීම සහ භාණ්ඩාගාරයෙන් ලැබුණු ප්‍රදාන සහ විලම්භිත ප්‍රාග්ධන ආදායම රු.1,349,337 කින් වැඩිවීමත් පුනරාවර්තන වැය රු.179,004 කින් අඩුවීමත් ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 දෘෂ්‍ය අක්‍රමිකතා

හිටපු සභාපතිවරයා විසින් 2008 දෙසැම්බර් 05 දින ලබාගෙන තිබූ රු.280,000 ක්වූ ලැප්ටොප් පරිගණක 02 ක් 2014 දෙසැම්බර් 23 වන විටත් අධිකාරිය වෙත නැවත භාරදී නොතිබුණි.

### 4.2 වර්ෂය තුල ඉලක්ක ගත ක්‍රියාකාරිත්වයට ලඟා නොවූ ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2011 වර්ෂයේ සිට සැලසුම් කරන ලද කුඩා හා මධ්‍යම ව්‍යාපාර ප්‍රතිපත්ති කෙටුම්පත සඳහා 2014 දෙසැම්බර් 24 දින තෙක් අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ආ) 2011 වර්ෂයේ සිට සැලසුම් කරන ලද දිස්ත්‍රික් ව්‍යාපාරික සංසද (DEF) පිහිටුවීමේ වැඩපිළිවෙල යටතේ සමාලෝචිත වර්ෂයේ ඉලක්කය වූ සෑම දිස්ත්‍රික්කයකම සංසද පිහිටුවා අවසන් කිරීමට හා ඒ වෙනුවෙන් වන සාකච්ඡා වට 75 ක් පැවැත්වීම යන ඉලක්කය කරා ලඟා

වී නොතිබුණි. මේ වන විට සංසද 10 ක් පමණක් ක්‍රියාත්මකව පවතින අතර සමාලෝචිත වර්ෂය සඳහා රු.300,000 ක් ප්‍රතිපාදන සලසා එයින් සියයට 95 ක් එනම් රු. 283,663 ක්ම වැයකර තිබුණද ක්‍රියාකාරී සැලැස්මෙන් අපේක්ෂිත භෞතික ප්‍රගතියක් ලඟාකරගෙන නොතිබුණි.

(ඈ) උපාධිධාරී ව්‍යාපාරික උද්‍යානය යටතේ සාර්ථක ව්‍යවසායකයන් 80 ක් අතරින් 20 ක් තෝරා ගැනීමේ ව්‍යාපෘතිය සඳහා වෙන් කළ රු. 2,500,000 කින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.234,448 ක් පමණක් වැයකර තිබුණි. ආරම්භක සාකච්ඡා පමණක් පවත්වා තිබුණු අතර කිසිදු සාර්ථක ව්‍යවසායකයෙක් තෝරාගෙන නොතිබුණි.

(ඇ) භූගෝලීය වශයෙන් විශේෂ වූ කර්මාන්ත දියුණු කිරීමේ වැඩසටහන යටතේ ලී බඩු, කොහු, අත්කම්, ලුහු ඉංජිනේරු, මැණික් කැපීම හා අත් යන්ත්‍ර රෙදි යන කර්මාන්ත 6 සඳහා රු.3,550,000 ප්‍රතිපාදන වෙන්කර තිබුණද, ලී බඩු හා මැණික් කැපීමේ කර්මාන්ත වල ක්‍රියාකාරී සැලැස්මෙන් අපේක්ෂිත කිසිදු ප්‍රගතියක් නොතිබුණි. අනෙක් කර්මාන්ත වලද ක්‍රියාකාරී සැලැස්මෙන් අපේක්ෂිත ප්‍රගතියෙන් සියයට 30 ට අඩු ප්‍රගතියක් පෙන්නුම් කර තිබුණි.

(ඉ) දිස්ත්‍රික්ක 03 ක තරඟකාරී ව්‍යාපාරික අවස්ථා හඳුනාගැනීමේ ධාරිතා සංවර්ධන වැඩ සටහන ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණද, ඒවා මෙහෙයවීමට දායක කරගන්නා ආයතන තෝරා ගැනීමේ කටයුතු අවසන් වී නොතිබුණි.

### 4.3 අරමුදල් ඌන උපයෝජනය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මේඇතුලත් ප්‍රධාන ක්‍රියාකාරීත්වයන් 09 ක් සඳහා වෙන්කළ රු.10,554,839 ක මුදලක් ඌන උපයෝජිතව පැවතුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාර ගිණුම් වර්ෂය ඉකුත් වී ඊලඟ වර්ෂයේ පෙබරවාරි 28 දිනට ප්‍රථම අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවද, 2013 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත ඉදිරිපත් කරන ලද්දේ 2014 ජූලි 14 දින දීය.

## 6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳ වරින් වර අධිකාරියේ සභාපතිවරයා දැනුවත් කරන ලදී. ඒ අනුව පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකල යුතුය.

(අ) ව්‍යාපෘති පාලනය
(ආ) ජ' නල් වවුචර් නඩත්තු කිරීම